# දේශපාලන පලිගැනීම් පිළිබඳව සොයා බැලීම සඳහා පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව හා පසුව සිදුකරන ලද ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පවතින මූලික ගැටළුකාරී තත්වයන්

වර්ෂ 2015 ජනවාරි 08 වන දින සිට වර්ෂ 2019 නොවැම්බර් 16 වන දින දක්වා කාලය තුළ දේශපාලන පලිගැනීම් පිළිබඳව සොයා බැලීම සඳහා පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව මෙම සතියෙහි පාර්ලිමේන්තුවෙහි සභාගත කර ඇති අතර, එකී වාර්තාවෙහි කරුණු පදනම් කරගනිමින් විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම සඳහා ගෙන ඇති පසු පියවර සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (Centre for Policy Alternatives - CPA) දැඩි ලෙස කනස්සල්ලට පත්ව සිටී. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නුදුරේදීම මෙකී පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව සම්බන්ධයෙන් අදහස් දක්වමින් විවරණයක් නිකුත් කරනු ඇති අතර වර්තමානයෙහි උද්ගතව ඇති තත්වය සම්බන්ධයෙන් මූලික අදහස් දැක්වීමක් වශයෙන්, පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ සොයාගැනීම් මගින් අධිකරණයේ ස්වාධීනත්වය, නීතියේ ආධිපත්‍යය සහ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය යන කරුණු කෙරෙහි උද්ගත වන ප්‍රතිවිපාක සම්බන්ධයෙන් බරපතල තත්වයන් ගණනාවක් පිළිබඳව සලකා බැලීමේ අවශ්‍යතාවයක් ඇති බව පෙන්වා දේ.

විමර්ශන කොමිෂන් සභාවන් පත් කිරීම වූ කලී පරීක්ෂණ ප්‍රමාද කිරීමේ උපක්‍රමයක් වශයෙන් භාවිත වන බව සහ ශ්‍රී ලංකාවේ අතීත අපරාධයන් හා දූෂණ සම්බන්ධයෙන් පිළියම් යෙදීමේ දී එහි අකාර්යක්ෂමතාවය පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මීට ඉහතදී ද පෙන්වා දී තිබේ. අංක 2157/44 දරන ගැසට් පත්‍රය මගින් වර්ෂ 2020 ජනවාරි 9 වන දින පරීක්ෂණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද අතර පසුව වර්ෂ 2020 ජනවාරි 22 වන දිනැති අංක 2159/16 දරන ගැසට් පත්‍රය හරහා එහි බලතල රාමුව සංශෝධනය කිරීම මගින් පරීක්ෂණ කොමිෂන් සභාව වෙත පුළුල් බලතල ප්‍රමාණයක් ලබා දෙන ලදි. මෙම අතිරේක බලතල අභියෝගයට ලක් කරමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු විසින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන ලදි. එම අවස්ථාවෙහි දී, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ස්වකීය අවධානය යොමු කරන ලද්දේ මෙම පුළුල් බලතල ඔස්සේ ඒ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතින විමර්ශන කටයුතු සහ නෛතික ක්‍රියාමාර්ගවලට බාධා ඇති කිරීමට හෝ ඒවා අගතියට පත් කිරීමට හෝ පරීක්ෂණ කොමිෂන් සභාව බලතල ක්‍රියාත්මකව පවතින කාල පරාසය ඇතුළත ආරම්භ කළ හැකි ක්‍රියාමාර්ගවලට බාධාකාරී තත්වයක් උද්ගත කිරීමට හැකි අන්දමේ බලයක් පරීක්ෂණ කොමිෂන් සභාව

වෙත ලැබේ ද යන කරුණු සම්බන්ධයෙනි. අදාල දේශපාලන පලිගැනීම් පිළිබඳව සොයා බැලීම සඳහා පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද දිනයේ සිට, වර්තමානයෙහි ක්‍රියාත්මක වෙමින් පවතින විමර්ශන කටයුතු සහ නෛතික ක්‍රියාමාර්ගවලට බාධා වන අන්දමට කටයුතු කිරීමට උත්සාහ දරා ඇති සේම, ස්වාභාවික යුක්තියේ මූලධර්ම නොසලකා හැරීම සහ දැනටමත් පවරා දී ඇති පුළුල් බලතල රාමුව ඉක්මවා යාම හේතුවෙන් එහි විමර්ශන පැවැත්වීම විවේචනයට ලක්ව ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පෙන්වා දෙනු ලැබේ.

දේශපාලන පලිගැනීම් පිළිබඳව සොයා බැලීම සඳහා පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව ජනාධිපතිවරයා වෙත භාර දීමෙන් අනතුරුව, වර්ෂ 1978 අංක 07 දරන විශේෂ ජනාධිපති කොමිෂන් සභා පනත යටතේ දේශපාලන පලිගැනීම් පිළිබඳව සොයා බැලීම සඳහා පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් අංක 2212/53 දරන ගැසට් පත්‍රය මගින් වර්ෂ 2021 ජනවාරි 29 දින ස්ථාපිත කරන ලදි. අනෙකුත් කරුණු අතර, විමර්ශන කොමිෂන් සභාවක නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී, ස්ථාපිතව ඇති අධිකරණ ආයතන සහ යාන්ත්‍රණයන් මග හැරීමේ හැකියාව සහිතව දේශපාලන පලිගැනීම් සම්බන්ධයෙන් වරදකරුවන් වූවන් මත ප්‍රජා අශක්නුතාවයක් පැනවීම සඳහා නිර්දේශ කිරීමට හැකියාව ඇති බලතල විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍ර මගින් සිදු කෙරෙන මූලික අදහස් දැක්වීමක් වශයෙන් පෙන්වාදෙනු ලබන්නේ, විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී අධිකරණයේ ස්වාධීනත්වය, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ස්වාධීනත්වය සහ මානව හිමිකම් උල්ලංඝණය කිරීම් සහ දූෂණ ක්‍රියාවන් සම්බන්ධයෙන් කරුණු විමර්ශනය කර නෛතික ක්‍රියාමාර්ගයන් ආරම්භ කළ විමර්ශකයින්ගේ ස්වාධීනත්වයට අගතියක් සිදුවිය හැකි බවට දැඩි ගැටළුකාරී තත්වයක් මෙමගින් ඇති කරනු ලැබිය හැකි බවයි. එවැනි ක්‍රියාමාර්ග ඔස්සේ අනාගතයේදී දේශපාලනික වශයෙන් සංවේදී යැයි සැලකෙන සිද්ධීන් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් උද්ගත කරනු ඇති අතර ශ්‍රී ලංකාවේ පවතින, එමගින් වරදකට දඬුවම් නොලැබ සිටීමේ වාතාවරණය තවදුරටත් ශක්තිමත් කරනු ලබන බව ද පෙන්වා දිය යුතු වේ.

දේශපාලනික අරමුණු සඳහා අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය අනිසි ලෙස භාවිතා කිරීම ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ ගැඹුරින් මුල්බැස ඇති ව්‍යුහාත්මක ගැටළුවක් බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දනී. කෙසේ වෙතත්, මෙම පරීක්ෂණ කොමිෂන් සභාව හෝ

විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව වැනි දේශපාලනීකරණය වූ ක්‍රියාවලීන් ඒ සම්බන්ධයෙන් වන විසඳුම නොවන අතර එමගින් මෙම ගැටළුව තවදුරටත් උග්‍ර කරනු ඇත. සියළුම පුරවැසියන්ට නීතියේ සමාන ආරක්ෂාවක් සහතික කිරීම සඳහා මෙම ආයතන තුළ ස්වාධීන හා අපක්ෂපාතී හා ශක්තිමත් ආචාර ධර්ම ප්‍රමිතීන් සමඟ විමර්ශන සහ නඩු පැවරීම් සඳහා ශක්තිමත් ව්‍යුහයන් ඇති කිරීම අත්‍යවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් ගත් කල, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාවය පෙන්වා දෙනු ලබන අතරම, දේශපාලන පලිගැනීම් සඳහා ලක්වන බව කියා සිටින ඕනෑම පුද්ගලයෙකුට පවත්නා අධිකරණ පද්ධතිය තුළ නීතිමය රැකවරණයෙහි ආරක්ෂාව සඳහා සහාය ලබා ගැනීමට හැකි විය යුතු වීමේ අවශ්‍යතාවය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් අවධාරණය කරනු ලබන්නේය.

තවද, අධිකරණ ක්‍රියාමාර්ගවලට බාධාකාරී විය හැකි පුළුල් බලතල සමූහයක් විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව වෙත ලබා දී තිබීමත්, එමගින් වගවීම සහ විනිවිදභාවය ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම සඳහා වන නඩු කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කළ පුද්ගලයින් සහ ආයතන ඉලක්ක කර ගැනීමට හේතු වන ඉදිරි ගමනක් ඇති අන්දමේ භයානක ප්‍රවණතාවක් ඇති කිරීමත් සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සැලකිලිමත් වේ.

මේ අනුව, ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන සියලුම පුරවැසියන් ඇතුළුව දේශපාලන පක්ෂ, ආගමික නායකයින් සහ සිවිල් සමාජය වෙතින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉල්ලා සිටිනු ලබන්නේ පරීක්ෂණ කොමිෂන් සභාවෙහි_සොයාගැනීම් විවේචනාත්මකව ඇගයීමට ලක්කර විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ස්ථාපිත කිරීම අභියෝගයට ලක් කරන ලෙසයි. අතීතයේ දී අත්දැක ඇති පරිදි, දේශපාලන විරුද්ධවාදීන් ඉලක්ක කර ගැනීමට සහ බොහෝ විට ප්‍රජා අශක්නුතාවයන් පැනවීමට භාවිතා කරන ලද වර්ෂ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති කොමිෂන් සභා පනත අවලංගු කරන ලෙස ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉල්ලා සිටිනු ලබයි. එවැනි ක්‍රියාමාර්ගයන්ට එරෙහි වීමට ඇති උදාසීනත්වය සහ අකමැත්ත හේතුවෙන් ඒකාධිපති පාලනය ශක්තිමත් කිරීමක් පමණක් සිදු වන අතර එමගින් ශ්‍රී ලංකාවේ දුර්වල ප්‍රජාතන්ත්‍රවාදයට පෙර නොවූ විරූ අන්දමේ අභියෝගයන් උද්ගත කරනු ඇත.